**මිහින්තලය ප්‍රාදේශීය සභාව - 2023**

**-------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මිහින්තලය ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට මිහින්තලය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රමිතයේ අංක 3.29 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේදී දේපළ හා උපකරණ මිලදී ගැනීම් රු.68,500 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා නොතිබුණි. | විවිධ තැන්පත් ගිණුමේ මෙය ඇතුළත් වී ඇති බව. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ලැබුණු රු.935,000 ක මෝටර් වාහනවල වටිනාකම සහ සභා අරමුදලින් මිලදීගත් රු.134,500 ක ලී බඩුවල වටිනාකම සමුච්චිත අරමුදලට බැරකර තිබුණි. | පිළිගන්නා බව. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී සභා කාර්යාල ගොඩනැගිල්ලේ කිලෝ වොට් 10 ක සූර්ය පැනල සවිකිරීම් පිරිවැය වූ රු.2,963,142 ක් ස්ථාවර වත්කමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | ස්ථාවර වත්කම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී LDSP ව්‍යාපෘතියෙන් ප්‍රාග්ධන ලැබීම් ලෙස රු.7,388,142 ක් පමණක් ලැබී තිබුණු නමුත් එයට අදාළ වියදම් රු.7,554,606 ක් ලෙස වැඩියෙන් දක්වා තිබුණි. | -එම- | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2023 වර්ෂයේ ඔක්තෝබර් හා නොවැම්බර් මාසවලට අදාළව රු.340,668 ක උසාවි දඩ ආදායම සමාලෝචිත වර්ෂයේ ආදායම ලෙස ගිණුම්ගත කර නොතිබීම නිසා ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම එම වටිනාකමෙන් අඩු වී තිබුණි. | 2012 වර්ෂයේ සිට පැවත එන ණය මුදලක් බැවින් දිගු කාලීන ණය ගැනීම් යටතේ පෙන්නුම් කර ඇති බව. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) | සභාවලට අයත් ඉඩමක කඩකාමර ඉදිකිරීම වෙනුවෙන් එම කඩකාමර ඉදිකළ පුද්ගලයන් විසින් සිදුකර තිබූ වියදම්වල වටිනාකම රු.48,614,832 ක් ලෙස තක්සේරු කර තිබුණු නමුත් ඒ සඳහා සභාව ඔවුන් වෙත ගෙවිය යුතු එම මුදල සභාවේ වියදමක් ලෙස හඳුනාගෙන ගිණුම්ගත නොකර සමුච්චිත අරමුදලට බැර කර තිබුණි. | පිළිගන්නා බව. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) | කඩ කාමර 67 ක් වෙනුවෙන් බිල්කළ යුතු ආදායම රු.3,912,000 ක් වුවත් එය රු.1,956,000 ක් ලෙස අඩුවෙන් බිල් කර තිබුණි. | පිළිගන්නා බව. | නිවැරදි වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (උ) | සමාලෝචිත වර්ෂයේදී රු.66,000 ක ලී බඩු මිලදී ගැනීම් දෙවරක් ගිණුම්ගත කර තිබීම නිසා ස්ථාවර වත්කම් එම වටිනාකමෙන් වැඩිවී තිබුණි. | -එම- | නිවැරදි වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඌ) | සමාලෝචිත වර්ෂයේදී ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ලැබුණු රු.1,690,000 ක පරිගණකවල වටිනාකම හා රු.2,735,000 ක් යන්ත්‍රවල වටිනාකම ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමට බැර නොකර සමුච්චිත අරමුදලට බැර කර තිබුණි. | -එම- | නිවැරදි වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

**1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පුනරාවර්තන වියදම් සඳහා ලැබුණු ප්‍රදාන සහ භෞතික සැලසුම් සඳහා ලැබුණු ප්‍රදානවල වටිනාකම විස්තීරණ ආදායම් ප්‍රකාශය අනුව රු.34,772,213 ක් වුවත් ගිණුම්කරණ සටහන් අනුව එම වටිනාකම් රු.24,876,523 ක් වූයෙන් රු.9,895,690 ක වෙනසක් විය. | පිළිගන්නා බව. | උපලේඛන අනුරූපී වාර්තා සමඟ සසදා නිවැරදි කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී පරිගණක මිලදී ගැනීම්, උපලේඛනය අනුව රු.1,956,616 ක් වුවද | -එම- | -එම- |

මූල්‍ය ප්‍රකාශන සටහන් 16 අනුව එය රු.2,129,616 ක් වුයෙන් රු.173,000 ක වෙනසක් විය.

**1.6.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම**

| විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|---|
| | රු. | | | |
| සුසාන භූමි | 110,300,000 | • ශේෂ සනාථ කිරීම්<br>• කාල විශ්ලේෂණ විස්තරාත්මක උපලේඛන | උපලේඛනයක් ඉදිරිපත් කර ඇති බව. | තහවුරු කිරීම් ඉදිරිපත් කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ වියදම රු.1,613,198 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ වියදම රු.3,760,906 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්**

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 1,280,200 | 1,674,260 | 1,674,260 | 101,844 | 1,045,050 | 1,296,700 | 1,296,700 | 101,844 |
| (ii) | කුලී | 10,368,103 | 15,329,120 | 1,417,169 | 16,018,600 | 8,419,674 | 8,336,571 | 11,007,626 | 2,106,649 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 225,100 | 635,813 | 634,308 | 60,005 | 105,000 | 143,840 | 85,340 | 58,500 |
| (iv) | වෙනත් ආදායම් | 4,359,850 | 19,025,959 | 17,865,420 | 7,153,108 | 4,084,250 | 7,170,583 | 6,908,338 | 5,992,569 |
| | | 16,233,253 | 36,665,152 | 21,591,157 | 23,333,557 | 13,653,974 | 16,947,694 | 19,298,004 | 8,259,562 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කායර්සාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **වරිපනම් හා බදු** | | |
| | 2023 ජනවාරි 01 දිනට පැවති රු.101,844 ක කසළ බදු හිඟය අයකර ගැනීමට 2023 වර්ෂයේදී ද සභාව අපොහොසත් වී තිබුණි. | කසළ අංගනය ඉදිකිරීමෙන් පසු අයකර ගැනීමට කටයුතු කරන බව. | කඩිනමින් අයකළ යුතුය. |
| (ආ) | **කුලී** | | |
| | 2023 දෙසැම්බර් 31 දිනට රු.1,628,148 ක කඩකුලී හිඟව පැවතුණි. | මේ වනවිට බෝහෝමයක් හිඟ මුදල් අයකරගෙන ඇති බව. | හිඟ කඩකුලී කඩිනමින් අයකර ගත යුතුය. |
| (ඇ) | **වෙනත් ආදායම්** | | |
| (i) | 2023 වර්ෂයේ හිඟ ද ඇතුලුව දැන්වීම් පුවරු වෙනුවෙන් ලැබිය යුතු රු.964,150 ක ගාස්තු අයකරගෙන නොතිබුණි. | 2024 වර්ෂයේදී අයකර ගැනීමට කටයුතු කරන බව. | කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2023 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ රු.3,012,849 ක් හා මුද්දර ගාස්තු රු.1,718,500 ක් ලැබිය යුතුව තිබුණි. | අයකර ගැනීමට කටයුතු කරන බව. | ලැබිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කායර්යන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණක් පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය හැකිව තිබූ නමුත් 2023 දෙසැම්බර් 31 දින වනවිටත් එම කාරණා වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | 2024 වර්ෂයේදී අතුරු ව්‍යවස්ථා පැනවීමට කටයුතු කරන බව. | ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව අතුරු ව්‍යවස්ථා පනවාගත යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2023 වර්ෂයේදී සභාව කසළ එකතු කර නොතිබුණ හෙයින් සභාවට ලැබිය යුතු ආදායමක් ද අහිමි වී තිබුණු අතර, බල ප්‍රදේශයේ කසළ අවිධිමත් ලෙස බැහැර වීමක් සිදු වී තිබුණි. | 2024 වර්ෂයේ සිට කසළ විධිමත් ලෙස බැහැර කිරීමට කටයුතු කරන බව. | බල ප්‍රදේශයේ කසළ එකතු කර විධිමත්ව බැහැර කළ යුතුය. |

**3.3 මතබේදයට තුඩුදුන් ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2023 පොසොන් උත්සවය වෙනුවෙන් ප්‍රාදේශීය සභාවේ නිලධාරීන් 04 දෙනෙකුට, ඔවුන්ගේ මාසික වැටුපට සමාන දීමනාවක් ලෙස 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132(ච) වගන්තිය සඳහන් කර රු.162,610 ක් 2023 ජුනි මාසයේදී ගෙවා තිබුණි. | අදාළ කාලයේ වැඩ කොටස් ඉටුකළ නිලධාරීන් වෙත මෙම දීමනා ගෙවා ඇති බව. ප්‍රාදේශීය සභා පනත අනුව ගෙවීම් කිරීම සධාරණ සහ යුක්ති සහගත බව. | ප්‍රාදේශීය සභා පනතේ 132(ච) වගන්තිය යටතේ මේ සඳහා ගෙවීම් කළ නොහැකි හෙයින් නැවත අයකර ගත යුතුය. |

**3.4 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| භාවිතයෙන් ඉවත්කර තිබුණු වාහන 05 ක් අපහරණය කිරීමට කටයුතු නොකර සභා පරිශ්‍රයේ ගාල්කර තිබුණි. | RK 80 අත් ට්‍රැක්ටරය සහ ගල්රෝල අලුත්වැඩියා කිරීමට හෝ එසේ කළ නොහැකි නම් වෙන්දේසි කිරීමට කටයුතු කරන බව. | අපහරණ කටයුතු කඩිනමින් නිම කළ යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1. ප්‍රතිපාදන නොසැලසීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සභාව විසින් සමාලෝචිත වර්ෂයේදී සිදුකිරීමට බලාපොරොත්තු වන කාර්යයන් සම්බන්ධයෙන් ක්‍රියාකාරී සැලස්මක් සකස් කර විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | 2024 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති බව. | ක්‍රියාකාරී සැලස්මක් සකස් කර විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. |